සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 2020

### 11 - ශ්‍රේණිය

### ව්‍යවසායකත්ව අධ්‍යයනය -I, II

**නම/විභාග අංකය : ..................................................................... කාලය : පැය 03 යි.**

## I පත්‍රය

**උපදෙස් :**

- **සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා, පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ' X' ලකුණ යොදන්න.**

01. සෑම විටම තමාගේ සාර්ථකත්වය තමාගේ දෛවය හා වාසනාව මත රඳා පවතින බව විශ්වාස කිරීම,

    1. නිර්මාණශීලීත්වයට එරෙහි වන්නක් වේ.
    2. අවදානම කළමනාකකරණය කර ගැනීමට මඟ පෙන්වන්නක් වේ.
    3. නව්‍යතා සම්පාදනයට හේතුවක් වේ.
    4. ආත්ම විශ්වාසයකින් යුතුව කටයුතු කිරීමට යොමු වීමක් වේ.

02. නිර්මාණශීලීත්වය තුළින්,

    1. ස්වාධීනත්වය තහවුරු වේ.
    2. අපේක්ෂිත අරමුණු ඉටුවීමක් සිදු වේ.
    3. අවිනිශ්චිතතාවයකට මුහුණ දීමට සිදු වේ.
    4. නව්‍යතා සම්පාදනයක් සිදු වේ.

03. ගෑස් සමාගමක් විසින් ආර්ථික පිරිමැසුම් සහිත කුඩා ප්‍රමාණයේ ගෑස් ටැංකියක් හඳුන්වා දීම සැලකිය හැක්කේ,

    1. නිෂ්පාදිත ප්‍රභේදනයක් ලෙසට ය.
    2. නිෂ්පාදිත විවිධාංගීකරණයක් ලෙසට ය.
    3. අලෙවි ප්‍රවර්ධනයක් ලෙසට ය.
    4. අලෙවි උපායමාර්ගයක් ලෙසට ය.

04. පරිසර වෙනස්වීම්වලට උචිත වන පරිදි අනුගත වීමට ව්‍යවසායකයකුට ඇති හැකියාව ,

    1. නිර්මාණශීලීත්වය වේ.
    2. නම්‍යශීලීත්වය වේ.
    3. නව්‍යතා සම්පාදනය වේ.
    4. ස්වාධීනත්වය වේ.

05. ව්‍යවසායකයකු අනාගතයේ දී සැබෑ කර ගැනීමට වෙර දරණ සිහිනය,

    1. අභිමතාර්ථයක් විය හැකිය.
    2. ඉලක්කය විය යුතුය.
    3. දැක්ම විය යුතුය.
    4. මනෝවිභීතිය විය හැකිය.

06. ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,

    1. ලාභ චේතනාවෙන් කටයුතු කිරීමයි.
    2. සැලැස්මකට අනුව කටයුතු කිරීමයි.
    3. රජයට ආදායම් බදු ගෙවීමට සිදු වීමයි.
    4. අවදානමකට මුහුණ දීමයි.

07. ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයකුට හිමිවන ප්‍රතිලාභයක් වන්නේ,

    1. රැකියා උත්පාදනයට දායක වීම වේ.
    2. දේශීය සම්පත් උපයෝජනය කිරීම වේ.
    3. රටේ සමස්ථ නිෂ්පාදනයට දායක වීම වේ.
    4. නිදහස හා ආත්ම තෘප්තියට පත් වීම වේ.

08. ව්‍යවසායකයෙකු බවට වූ පත් වීම සඳහා කාන්තාවන් තුළ පවතින ශක්තියක් වන්නේ,

1. පුරුෂාධිපත්‍යක් පැවතීමයි.
2. ස්වයං විනයක් පැවතීමයි.
3. දැඩි පාරිභෝගික පිරිසක් තිබීමයි.
4. නීතිරීති වලට අනුව කටයුතු කිරීමයි.

09. නිසි ලෙස සේවක අර්ථසාධක අරමුදල් දායක කිරීම ව්‍යවසායකයකුගේ,

1. ආර්ථික වගකීමකි.
2. සදාචාරාත්මක වගකීමකි.
3. නීතිමය වගකීමකි.
4. පරාර්ථකාමී වගකීමකි.

10. ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට ධනාත්මකව හා සෘණාත්මකව බලපෑම් ඇති කරන බලවේග හා සාධක සියල්ල,

1. ආසන්න පරිසරය වේ.
2. අභ්‍යන්තර පරිසරය වේ.
3. ගෝලීය පරිසරය වේ
4. ව්‍යාපාර පරිසරය වේ.

11. මූල්‍යායතන විසින් ව්‍යාපාරිකයින් උදෙසා ලබා දෙන ණය සඳහා ඇති කරන පොළී ප්‍රතිශතය 5% කින් පහත හෙලීම ශදූඅත විශ්ලේෂණයට අනුව,

1. ශක්තීන් වේ.
2. අවස්ථා වේ.
3. තර්ජන වේ.
4. අභියෝග වේ.

12. ව්‍යවසායකයකු සිය ව්‍යාපාරය සඳහා එල්ල විය හැකි **තර්ජන** හඳුනාගැනීම සඳහා විශ්ලේෂණය කරනුයේ,

1. ආර්ථික පරිසරය යි.
2. ගෝලීය පරිසරය යි.
3. අභ්‍යන්තර පරිසරය යි.
4. බාහිර පරිසරය යි.

13. ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයකුට **තාක්ෂණික සේවා දිරිගැන්වීම්** ලබා ගත හැකි ආයතනයක් වන්නේ,

1. කාර්මික සංවර්ධන මණ්ඩලය වේ.
2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව වේ.
3. ලංකා බැංකුව වේ.
4. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වේ.

14. කුඩා පරිමාණ ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

1. අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වීම.
2. කුඩා ප්‍රදේශයකට ව්‍යාපාර කටයුතු සීමා වී තිබීම.
3. සංස්ථාපිත සමාගම් ලෙසට සංවිධානය වී තිබීම.
4. නිෂ්පාදන විදේශීය වෙළෙඳපොළ කරා යොමු කිරීම.

15. බෝතල් කළ පානීය ජලය තුළින් සපුරාලන්නේ පුද්ගලයකුගේ,

1. අවශ්‍යතාවය වේ.
2. වුවමනා වේ.
3. රුචිකත්වය වේ.
4. අපේක්ෂාවන් වේ.

16. භාණ්ඩ වලට සාපේක්ෂව සේවා නිෂ්පාදිත,

1. අස්පෘශ්‍ය වන අතර ගබඩා කළ හැකිය.
2. අස්පෘශ්‍ය වන අතර සපයන්නාගෙන් වෙන් කළ නොහැකිය.
3. සමාජාතීය වන අතර, අස්පෘශ්‍ය වේ.
4. සපයන්නාගෙන් වෙන් කළ හැකි අතර, අස්පෘශ්‍ය වේ.

17. ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීමේ දී **සේවකයින් නිසි ලෙස මෙහෙය වීම** අයත්වන්නේ කුමන ව්‍යවසායකත්ව භූමිකාවට ද?

1. අයිතිකරුගේ භූමිකාව
2. කළමනාකරුගේ භූමිකාව
3. නායකයාගේ භූමිකාව
4. සුපරීක්ෂණ භූමිකාව

18. වතු ආශ්‍රිත රැකියාවල නියුතු කම්කරුවන්ගේ දෛනික වැටුප රු. 1 000 ක් බව රජය විසින් තීරණය කර ව්‍යාපාර ගැසට් නිවේදනයක් නිකුත් කිරීම, කුමන ව්‍යාපාර බාහිර පරිසර තත්ත්වයක් ද?

1. ආර්ථික පරිසරය වේ. 2. ආසන්න පරිසරය වේ.
3. ප්‍රජා පරිසරය වේ. 4. දේශපාලන හා නෛතික පරිසරය වේ.

19. ව්‍යාපාර ආශ්‍රිත කළමනාකරණ ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු පුද්ගලයකුට ලැබෙන මූල්‍ය ප්‍රතිලාභය වන්නේ,

1. ආදායම් වේ. 2. වැටුප් වේ.
3. ලාභ වේ. 4. අතිකාල දීමනා වේ.

20. අභ්‍යන්තර පරිසර සාධකයක් නොවන්නේ මින් කවරක් ද?

1. කළමනාකරුවන් 2. සේවකයන්
3. සම්පත් 4. සැපයුම්කරුවන්

21. නව ව්‍යාපාර කටයුත්තකට පිවිසීමට ප්‍රථමව ව්‍යවසායකයෙකු විසින් කළ යුතු මූලික කාර්යය වන්නේ,

1. වෙළෙඳපොළ අධ්‍යයනයක් සිදු කිරීමයි.
2. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමයි.
3. කළමනාකරුවන් නොවන සේවකයන් බඳවා ගැනීමයි.
4. ව්‍යාපාර ආචාරධර්ම අනුව මෙහෙයුම් කටයුතු සිදු කිරීමයි.

22. ව්‍යාපාර සැලසුමක සාරාංශය,

1. මුදල් ප්‍රවාහ සැලැස්ම වේ. 2. කාරක ප්‍රාග්ධන ඇස්තමේන්තුව වේ.
3. විධායක සාරාංශය වේ. 4. පරිපාලන සැලසුම වේ.

23. සංවිධාන සටහනේ මූලික තනතුරු හා වගකීම්, පරිපාලන වියදම්, පරිපාලනයට අදාල ස්ථාවර වත්කමේ ආදිය ඇතුළත් කරන්නේ,

1. මූල්‍ය සැලසුම තුළ ය. 2. ආයෝජන සැලසුම් තුළ ය.
3. නිෂ්පාදන සැලසුම තුළ ය. 4. පරිපාලන සැලසුම තුළ ය.

24. අලෙවි සැලැස්මක අලෙවි උපායමාර්ග යටතේ ඇතුළත් කරන **අලෙවිකරණ මිශ්‍රණයේ** අයිතමයක් නොවන්නේ මින් කවරක් ද?

1. නිෂ්පාදිතය 2. මිල
3. වෙළෙඳපොළ සමීක්ෂණය 4. ප්‍රවර්ධනය

25. ව්‍යාපාර සැලැස්මක් යටතේ පෙන්නුම් කරන ආයෝජන ඇස්තමේන්තුවක ඇතුළත් කෙරෙන අයිතමයක් වන්නේ,

1. නිෂ්පාදන පිරිවැය දත්ත වේ.
2. කාරක ප්‍රාග්ධන වියදම් දත්ත වේ.
3. අපේක්ෂිත මුදල් ගලා ඒම් හා ගලා යැම් දත්ත වේ.
4. ඇස්තමේන්තුගත මුලු ආදායම හා මුලු වියදම වේ.

26. ඉලක්ක පාරිභෝගිකයා ආකර්ශනය කර ගැනීම සඳහා භාවිතා කළ හැකි නව තාක්ෂණික ක්‍රමයක් වන්නේ,

1. රූපවාහිනිය වේ.
2. අත්පත්‍රිකා වේ.
3. මුහුණු පොත ( Face Book) වේ.
4. සමාජ සේවා වැඩසටහන් සංවිධානය කිරීම වේ.

27. අතිරේක ප්‍රාග්ධන සම්පාදනය කර ගැනීම වෙනුවෙන් කුඩා පරිමාණ ව්‍යවසායකයකුට ණය මුදලක් ලබා ගත හැකි වාණිජ බැංකුවක් වන්නේ මින් කවරක්ද?

1. ජාතික ඉතිරි කිරීමේ බැංකුව 2. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
3. සණස සංවර්ධන බැංකුව 4. ලංකා බැංකුව

28. "ප්‍රසිද්ධ වෙළෙඳ නාමයක් යටතේ නිෂ්පාදිත අලෙවි කිරීම වෙනුවෙන් වෙනත් පාර්ශව විසින් ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සිදු කරයි." මෙවැනි ව්‍යාපාර,

1. කේවල ස්වාමී ව්‍යාපාර වේ.
2. වරලත් ව්‍යාපාර වේ.
3. සංස්ථාපිත සමාගම් ව්‍යාපාර වේ.
4. හවුල් ව්‍යාපාර වේ.

29. අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් කළමනාකරණ කටයුතු මෙහෙය වන නෛතික පුද්ගලභාවයක් හිමිවන ව්‍යාපාර සංවිධාන ප්‍රභේදයක් වන්නේ,

1. සීමා සහිත පුද්ගලික සමාගම්
2. වරලත් ව්‍යාපාර
3. රජයේ දෙපාර්තමේන්තු ව්‍යාපාර
4. හවුල් ව්‍යාපාර

30. හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි ආකාර වන්නේ,

1. කේවල ස්වාමී හා හවුල් ව්‍යාපාර වේ.
2. පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා රාජ්‍ය අංශයේ ව්‍යාපාර වේ.
3. හවුල් ව්‍යාපාර හා වරලත් ව්‍යාපාර වේ.
4. රාජ්‍ය සංස්ථා ව්‍යාපාර හා රජයේ දෙපාර්තමේන්තු

31. ඉදිරි මාසයේ ශේෂය කොපමණ ද? යන්න ගණනය කර ගත හැකි වන්නේ,

1. අපේක්ෂිත මුදල් ගලා ඒමේ හා අපේක්ෂිත මුදල් ගලා යෑම් එකතු කිරීමෙනි.
2. අපේක්ෂිත මුදල් ගලා යෑම් වලින් අපේක්ෂිත මුදල් ගලා ඒම් අඩු කිරීමෙනි.
3. අපේක්ෂිත ආදායම් වල එකතුවෙන් අපේක්ෂිත වියදම් වල එකතුව අඩු කිරීමෙනි.
4. අපේක්ෂිත මුදල් ගලා ඒමේ හා අපේක්ෂිත මුදල් ගලා යෑම් අඩු කිරීමෙනි.

32. "කාන්තා ව්‍යවසායිකාවක වන හංසලී තම ව්‍යාපාරයේ සීමා සහිත සම්පත් කාර්යක්ෂමව භාවිතයට ගනියි." මෙය,

1. සදාචාරාත්මක වගකීමක් වේ.
2. ආර්ථික වගකීමක් වේ.
3. පරාර්ථකාමී වගකීමක් වේ.
4. සමාජ වගකීමක් වේ.

33. නිෂ්පාදන සැලැස්මකට අදාල තොරතුරුවලින් A වලින් දැක්වෙන හිස්තැනේ තිබිය යුතු පිළිතුර තෝරන්න.

| .........A.......... | + | සෘජු ශ්‍රම පිරිවැය | + | නිෂ්පාදනයට අදාල වෙනත් පිරිවැය | = | මුළු නිෂ්පාදන පිරිවැය |
|---|---|---|---|---|---|---|

1. ප්‍රාථමික පිරිවැය යි.
2. සෘජු ද්‍රව්‍ය පිරිවැය යි.
3. නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය යි.
4. නිෂ්පාදන ඒකකයක පිරිවැය යි.

34. 'X' තීරුවේ ව්‍යාපාර කිහිපයක් 'Y' තීරුවේ ඉලක්ක පාරිභෝගික කණ්ඩායම් කිහිපයක් දැක්වේ. (පිළිවෙලින් නොවේ.)

| X | Y |
|---|---|
| 1 - අභ්‍යාස පොත් | A - ගෘහනීන් |
| 2 - ආයුර්වේද ඖෂධ | B - පාසල් සිසුන් |
| 3 - හරිත නිවාඩු නිකේතන | C - රෝගීන් |
| 4 - LP ගෑස් | D - සංචාරකයින් |

'X' තීරුවේ සඳහන් ව්‍යාපාර 'Y' තීරුවේ සඳහන් ඉලක්ක පාරිභෝගික කණ්ඩායම් සමඟ පිළිවෙලින් ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

1. C , A , B හා D ය.
2. A , D , B හා C ය.
3. D , C , A හා B ය.
4. B , C , D හා A ය.

- ප්‍රශ්න අංක 35 සිට 38 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් විස්තරය අදාල වේ.

දේශීය ආයුර්වේද වෛද්‍යවරයකු විසින් - Covid 19 (කොරෝනා) වසංගතයට එරෙහිව භාවිත කළ හැකි ඖෂධයක් නිපදවා එම ඖෂධය මුදල් අය කිරීමකින් තොරව ජනතාවට ලබා දීමට අපේක්ෂා කරයි.

කොරෝනා වසංගත ව්‍යාප්තියත් සමග ඇතැම් සුපිරි වෙළෙඳසැල් තම කාර්ය මණ්ඩලය යොදා ගනිමින් පාරිභෝගික නිවෙස් වෙතට භාණ්ඩ (අලෙවි කිරීම) බෙදා හැරීමට කටයුතු යෙදීය.

ව්‍යාපාරිකයින් ලබා ගෙන ඇති ණය සඳහා වාරික ගෙවීමට ඇති කාලය දීර්ඝ කිරීමට රජය විසින් මූල්‍ය ආයතන වලට උපදෙස් ලබා දීමක්ද සිදු කරනු ලැබීය.

ඉහත විස්තරයට අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

35. දේශීය ආයුර්වේද වෛද්‍යවරයා,

1. ව්‍යාපාර ව්‍යවසායකයකි.
2. ව්‍යවසායෙකු නොවන ව්‍යාපාරිකයකි.
3. ආයතනික ව්‍යවසායකයකි.
4. සමාජයීය ව්‍යවසායකයකි.

36. නිෂ්පාදිත ඖෂධය මුදල් අය කිරීමකින් තොරව ජනතාවට ලබා දීම තුළින් අත්කර ගත හැකි ප්‍රතිලාභ වන්නේ,

1. ආකර්ශනීය මූල්‍ය ප්‍රතිලාභයක් වේ.
2. ආදායම් බදු සහන හිමිකර ගැනීම වේ.
3. ආත්ම තෘප්තිය හා සමාජයීය පිළිගැනීමකට ලක්වීම වේ.
4. රාජ්‍ය වියදම් අවම කිරීමට දායක වීමක් වේ.

37. සුපිරි වෙළෙඳසැල් මගින් ගනු ලැබූ ක්‍රියාමාර්ගය,

1. ව්‍යාපාර ආචාරධර්ම ඉටු කිරීමක් වේ.
2. නවෝත්පාදන ආකාරයක් වේ.
3. අවදානම් දැරීමක් වේ.
4. සමාජ සංවර්ධනයට යොමු වීමක් වේ.

38. රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගය ව්‍යාපාරිකයාට ලබාදුන්,

1. මූල්‍ය අනුග්‍රහයක් වේ.
2. මූල්‍ය දිරිගැන්වීමක් වේ.
3. මූල්‍ය නොවන දිරිගැන්වීමක් වේ.
4. ආයෝජන සේවා පහසුකම් සැලසීමක්වේ.

39. ව්‍යවසායකයන්ට ම ආවේනික වූ විශේෂිත ගති පැවතුම්, ආකල්ප, විශ්වාස, හැසිරීම් රටා, චාරිත්‍ර වාරිත්‍ර, සම්මත යනාදී අංශවල එකතුව,

1. ව්‍යාපාර දැක්ම වේ.
2. ව්‍යවසායකත්ව සංස්කෘතිය වේ.
3. ව්‍යවසායකත්ව ගතිලක්ෂණ වේ.
4. ව්‍යාපාර ආචාරධර්ම වේ.

40. ව්‍යාපාර විසින් පිළියෙල කරනු ලබන **මූල්‍ය සැලැස්ම** සෑම විටම,

1. වර්තමානය සමඟ සම්බන්ධ වූවකි.
2. අතතීත ප්‍රගතිය සමාලෝචනයට සම්බන්ධ වූවකි.
3. අනාගතය සමඟ සම්බන්ධ වූවකි.
4. අතීත හා අනාගත යන කාලසීමා දෙකටම සම්බන්ධ වූවකි.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 2020

**11 - ශ්‍රේණිය**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය - II**

**නම/විභාග අංකය : ..................................................................**

## II පත්‍රය

**උපදෙස් :**

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. ප්‍රසිද්ධ පාවහන් නිෂ්පාදන ආයතනයක රැකියාව කර විශ්‍රාම ලැබූ සමන් මහතා පදම් කළ සම් භාවිතයෙන් නවතාවයෙන් යුතු කාන්තා පාවහන් නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාමට සැලසුම්කරයි. ඉදිරි මාසයේ පළමුවැනි දින ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර පහත සඳහන් දත්ත ඉදිරිපත් කෙරේ.

| | |
|---|---|
| • ආයෝජිත මුදල | රු. 500 000 |
| • යන්ත්‍ර උපකරණ මිලදී ගැනීමට | රු. 40 000 |
| • කඩකුලී, විදුලිය ආදී නිෂ්පාදනයට අදාල වෙනත් වියදම් | රු. 70 000 |
| • ප්‍රචාරණ හා විකුණුම් වියදම් | රු. 36 000 |

ඉදිරි මාසය සඳහා පාවහන් ජෝඩු 2000 ක් නිෂ්පාදනය කර පාවහන් ජෝඩු 1800 ක් මෙම මාසය තුළ දී අලෙවි කිරීමට අපේක්ෂා කරයි. පාවහන් ජෝඩුවක නිෂ්පාදන පිරිවැය රු. 200 ක් වන අතර පාවහන් ජෝඩුවක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් ශ්‍රමිකයින්ට රු. 80 ක කුලියක් (වැටුපක්) ගෙවිය යුතුය. නිෂ්පාදන පිරිවැයට 50% ක ලාභයක් එකතු කර, පාවහන් ජෝඩුවක විකුණුම් මිල තීරණය කරනු ලබයි. ගුණාත්මක බවින් යුතු පාවහන් නිෂ්පාදනය කර, හොඳම ව්‍යවසායකයා බවට පත් වීමට සමන් මහතා අපේක්ෂා කරයි.

ඉහත සිද්ධිය අනුව ( i ) සිට ( x ) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. (අ) සමන් මහතා සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද?

(ආ) සමන් මහතා කුමන වර්ගයේ ව්‍යවසායකයෙක්ද?

ii. ව්‍යවසායකයෙකු ලෙසට සමන් මහතා තුළින් විද්‍යාමාන වන ව්‍යවසායකත්ව ගතිලක්ෂණ දෙකක් ඉදිරිපත් කරන්න.

iii. ව්‍යවසායකයෙකු ලෙස සමන් මහතාට ලබා ගත හැකි මූල්‍ය ප්‍රතිලාභයක් හා මූල්‍ය නොවන ප්‍රතිලාභයක් ඉදිරිපත් කරන්න.

iv. ව්‍යවසායකයෙකු ලෙස සමන් මහතා තුළ තිබිය යුතු මූලික කුසතලා දෙකක් සඳහන් කරන්න.

v. මෙම සිද්ධියේ සඳහන් වන නිෂ්පාදිතය වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ දී මතුවිය හැකි අභියෝග දෙකක් ලියන්න.

vi. නිෂ්පාදන පිරිවැයේ මූලිකාංග ඉදිරිපත් කරන්න.

vii. ඉදිරි මාසයේ නිෂ්පාදිතයට අදාළ පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) නිෂ්පාදනයට ආදාළ මුළු ශ්‍රම පිරිවැය

(ආ) නිෂ්පාදනයට අදාළ මුළු පිරිවැය

viii. ඉදිරි මාසයේ මුළු නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව ලේඛනයක ආකාරයෙන් ඉදිරිපත් කරන්න.

ix. ඉදිරි මාසයේ අපේක්ෂිත ලාභය ගණනය කරන්න.

x. ඉදිරි මාසයේ අපේක්ෂිත මුදල් ගලා ඒමේ දෙකක් වටිනාකම් සහිතව දක්වන්න. **(ලකුණු 2x10=20)**

02. i. නිෂ්පාදන සාධක හතර නම් කරන්න.

ii. ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ වන පහත සඳහන් අංශයන් සඳහා නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරන්න.

(අ) ප්‍රාථමික අංශය :

(ආ) ද්විතීයික අංශය :

iii. "ව්‍යවසායකත්වය, රටක සම්පතකි." මීට අදාළව කරුණු හතරක් ඉදිරිපත් කරන්න.

iv. "කුඩා පරිමාණ ව්‍යාපාරවලින් බොහොමයක් ආරම්භ කර කෙටි කාලයක් තුළ වැසී යන බව කියවේ." මෙසේ වීමට හේතු විය හැකි කරුණු හතරක් ඉදිරිපත් කරන්න.

v. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර අවධානය යොමු කළ යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

**(ලකුණු 2x5=10)**

03. i. සාම්ප්‍රදායික ව්‍යාපාරිකයින්ට සාපේක්ෂව ව්‍යවසායකයින් වෙනස් වන්නේ, කවර අන්දමකින් ද? කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.

ii. හවුල් ව්‍යාපාර වල දක්නට ලැබෙන සීමා දෙකක් සඳහන් කරන්න.

iii. ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංවර්ධනයට එරෙහි වන **සමාජයීය සාධක** දෙකක් ඉදිරිපත් කරන්න.

iv. ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි කළමනාකරුවන් වර්ග හතරක් නම් කරන්න.

v. කාන්තාවන් ව්‍යාපාර කිරීම සඳහා ඉදිරිපත් වීමේ අවශ්‍යතාව, ශ්‍රී ලංකාවට අදාල වන අයුරින් කරුණු හතරකින් ඉදිරිපත් කරන්න. **(ලකුණු 2x5=10)**

04. i. ව්‍යාපාර සැලසුම් සම්බන්ධයෙන් අවධානය යොමු කරන පාර්ශව දෙකක් නම් කරන්න.

ii. ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත මූලිකාංග වලින් හතරක් සඳහන් කරන්න.

iii. මූල්‍ය සැලසුමක් පිළියෙල කිරීම තුළින් ව්‍යවසායකයෙකුට අත්වන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

iv. අලෙවි සැලැස්මක ඇතුලත් කරන **අලෙවි වියදම්** සඳහා නිදසුන් හතරක් සඳහන් කරන්න.

v. ඔබ කැමති නිෂ්පාදිතයක් නිදසුනක් ලෙසට ගෙන ඊට අදාලව කෙටියෙන් පැහැදිළි කරන්න.

**(ලකුණු 2x5=10)**

05. i. කුඩා පරිමාණ ව්‍යවසායකයෙකුට අතිරේක ප්‍රාග්ධනය රැස්කර ගත හැකි විකල්ප ක්‍රම දෙකක් දක්වන්න.

ii. නිර්මාණශීලීත්වයට බධාකාරී විය හැකි සාධක දෙකක් ඉදිරිපත් කරන්න.

iii. වෙළෙඳපොළ විශ්ලේෂණයේ දී තොරතුරු රැස්කර ගත හැකි මූලාශ්‍ර හතරක් සඳහන් කරන්න.

iv. ව්‍යාපාර අදහස් ලබා ගත හැකි මූලාශ්‍ර හතරක් ඉදිරිපත් කරන්න.

v. හොඳ ව්‍යාපාර අවස්ථාවක පවතින ලක්ෂණ වලින් දෙකක් සඳහන් කරන්න. **(ලකුණු 2x5=10)**

06. රු. 300 000 ක් වටිනා පෞද්ගලික ගොඩනැගිල්ලක, රු. 500 000ක් යොදා පාසල් පොත්පත් හා උපකරණ අලෙවිකිරීමේ තමාගේම ව්‍යාපාරය් ආරම්භ කිරීමට සහන් අබේනායක අපේක්ෂා කරයි. SMART SHOP නමින් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට අදහස් කරයි. රු. 400 000 ක බැංකු ණය මුදලක් ලබා ගෙන රු. 250 000 ක ඡායා පිටපත් යන්ත්‍රයක් හා රු. 150 000 ක ලී බඩු උපකරණ ලබා ගැනීමට සූදානම් වේ.

ඇස්තමේනතුගත අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

- ලියාපදිංචි කිරීමේ ගාස්තු — රු. 4 000
- ව්‍යාපාර සැලසුම් පිළියෙල කිරීමේ වියදම් — රු. 18 000
- මාසික විදුලිය හා දුරකථන ගාස්තු — රු. 7 500
- ලිපිද්‍රව්‍ය අත්පත් කර ගැනීමේ හා අනෙකුත් මෙහෙයුම් වියදම් — රු. 280 000

ඉහත තොරතුරු වලට අනුව ,

i. ඉදිරි මාසය සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරන්න. **(ලකුණු 04)**

ii. පහත සඳහන් ආකෘතියට අනුව මුළු ආයෝජන ඇස්තමේන්තුව සකස් කරන්න.

(රුපියල්)

| | අයිතිකරු | බැංකු ණය | මුළු ආයෝජන |
|---|---|---|---|
| <u>ස්ථාවර වත්කම්</u><br>•<br>•<br>•<br><u>මෙහෙයුම් වියදම්</u><br>•<br>•<br>කාරක ප්‍රාග්ධනය<br>•<br>•<br>• | | | |
| මුළු ආයෝජන | | | |
| | | | |

**(ලකුණු 06)**

07. i. (අ) "ව්‍යාපාර අදහස්" යන්න පැහැදිළි කරන්න.

(ආ) හොඳ ව්‍යාපාර අදහසක් තෝරා ගැනීමේ **විශ්ලේෂණ ක්‍රම** දෙකක් නම් කරන්න.

ii. අතීත ව්‍යාපාර පරිසරයට සාපේක්ෂව **නූතන ව්‍යාපාර පරිසර ප්‍රවණතා** දෙකක් ඉදිරිපත් කරන්න.

iii. "පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රයේ වෙනස්වීම් වලට භාජනය වී ඇත." මෙම තත්ත්වය සනාථ කිරීම සඳහා කරුණු හතරක් ඉදිරිපත් කරන්න.

iv. මහා පරිමාණ ව්‍යාපාරයක පරිපාලන සැලැස්මක් පිළියෙල කිරීමේ දී ඇතුළත් කරන **සංවිධාන සටහනක** පෙන්නුම් කළ යුතු පාර්ශව හතරක් බලය අනුපිළිවෙල අනුව ඉදිරිපත් කරන්න.

v. ව්‍යාපාරයක **සමාජ වගකීම් මට්ටම්** හතර නම් කරන්න. **(ලකුණු 2x5=10)**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 2020

### ව්‍යවසායකත්ව අධ්‍යයනය

### 11 ශ්‍රේණිය - පිළිතුරු

### I - පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | **1** | 11 | **2** | 21 | **1** | 31 | **4** |
| 02 | **4** | 12 | **4** | 22 | **3** | 32 | **2** |
| 03 | **1** | 13 | **1** | 23 | **4** | 33 | **2** |
| 04 | **2** | 14 | **2** | 24 | **3** | 34 | **4** |
| 05 | **3** | 15 | **2** | 25 | **2** | 35 | **4** |
| 06 | **4** | 16 | **2** | 26 | **3** | 36 | **3** |
| 07 | **4** | 17 | **3** | 27 | **4** | 37 | **2** |
| 08 | **2** | 18 | **4** | 28 | **2** | 38 | **2** |
| 09 | **3** | 19 | **2** | 29 | **1** | 39 | **2** |
| 10 | **4** | 20 | **4** | 30 | **2** | 40 | **3** |

**(නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 40 යි.)**

### II - පත්‍රය

01. i. (අ) ඇඳුම් - පැළඳුම් **(ලකුණු 01)**
(ආ) ව්‍යාපාර ව්‍යවසායකත්ව **(ලකුණු 01)**

ii.
- දැක්මක් අනුව කටයුතු කිරීම
- නිර්මාණශීලීත්වය
- නවෝත්පාදනය
- අවදානම් දැරීම
- ආරම්භක ශක්තිය **(කරුණු 02 කට ලකුණු 02)**

iii. <u>මූල්‍ය ප්‍රතිලාභ</u>

- ආකර්ශනීය ලාභයක්
- ආදායම්

<u>මූල්‍ය නොවන ප්‍රතිලාභ</u>

- ආත්ම තෘප්තිය/ සතුට
- ස්වාධීනත්වය
- සමන් පිළිගැනීමකට ලක් වීම
- කීර්ති, ප්‍රශංසා ලැබීම **(මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ 01 කට ලකුණු 01 බැගින් ලකුණු 02)**

iv.
- සංකල්පනාත්මක කුසලතා
- මානව කුසලතා
- තාක්ෂණික කුසලතා
- සන්නිවේදන කුසලතා
- උපදේශන කුසලතා
- කණ්ඩායම සමඟ කටයුතු කිරීමේ කුසලතා **(කරුණු 02 කට ලකුණු 02)**

v.
- වෙනත් තරඟකාරී නිෂ්පාදකයින් / සැපයුම්කරුවන් සිටීම
- නිෂ්පාදන සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය කලට වේලාවට සපයා ගැනීම
- වෙනත් තරඟකාරී නිෂ්පාදිත ගුණත්වයේ උසස් වීම

**(පිළිගත හැකි වෙනත් කරුණු) (කරුණු 01 කට ලකුණු 01 බැගින් ලකුණු 02)**

vi. • අමුද්‍රව්‍ය (සෘජු ද්‍රව්‍ය) පිරිවැය
• සෘජු ශ්‍රම පිරිවැය
• වෙනත් නිෂ්පාදන වියදම් **(ලකුණු 02 සඳහා මෙම කරුණු 03 තිබිය යුතුය.)**

හෝ

• ප්‍රාථමික පිරිවැය
• නිෂ්පාදන (කම්හල්) පොදු කාර්ය පිරිවැය

vii. (අ) ඒකක 2000 x රු. 80 = රු. 160 000 **(ලකුණු 01)**
(ආ) ඒකක 2000 x රු. 200 = රු. 400 000 **(ලකුණු 01)**

viii.

| | රු. | |
|---|---|---|
| • සෘජු ද්‍රව්‍ය පිරිවැය | 170 000 | **(ලකුණු 01)** |
| • සෘජු ශ්‍රම පිරිවැය | 160 000 | **(ලකුණු $\frac{1}{2}$)** |
| • නිෂ්පාදනයට අදාල වෙනත් වියදම් | 7 000 | **(ලකුණු $\frac{1}{2}$)** |
| මුළු නිෂ්පාදන පිරිවැය | 400 000 | |

ix.

| | | රු. | |
|---|---|---|---|
| විකුණුම් ආදායම (1800 x රු. 300) | | 540 000 | |
| අඩු කළා | | | |
| නිෂ්පාදිත පිරිවැය (1800 x 200) | 360 000 | | |
| ප්‍රචාරණ හා විකුණුම් වියදම් | 36 000 | (396 000) | |
| ලාභය | | 144 000 | **(ලකුණු 02)** |

හෝ

| | | |
|---|---|---|
| 1800 x රු. 100 | = | 180 000 |
| ප්‍රචාරණ හා විකුණුම් වියදම් | = | (36 000) |
| | = | 144 000 |

x. • ප්‍රාග්ධනය ලෙස මුදල් යෙදවීම රු. 500 000 **(ලකුණු 01)**
• විකුණුම් වලින් මුදල් ලැබීම රු. 540 000 **(ලකුණු 01)**

**(ලකුණු 2x10=20)**

02. i. • භූමිය • ශ්‍රමය
• ප්‍රාග්ධනය • ව්‍යවසායකත්වය ( $\frac{1}{2}$ x 04 = **ලකුණු** 02)

ii. (අ) <u>ප්‍රාථමික අංශය</u>

• කෘෂිකර්මය • ධීවර කටයුතු
• සත්ත්ව පාලනය • පතල් හා කැණීම් **(අයිතම 02 කට ලකුණු 01)**

(ආ) <u>ද්විතීයික අංශය</u>

• නිෂ්පාදිත කර්මාන්ත • ඉදිකිරීම් **(අයිතම 02 කට ලකුණු 01)**

iii. • රැකියා අවස්ථා ජනනය වීම.
• දේශීය සම්පත් උපයෝජනයට ලක් වීම.
• විදේශ විනිමය ගලා ඒමක් සිදු වීම.
• නව භාණ්ඩ හා සේවා බිහි වීම.
• ආදායම් බෙදී යාමේ විෂමතා අඩු වීම.
• සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම.
• ආර්ථික සංවර්ධනය වේගවත් වීම.
• ජන ජීවිතය උසස් මට්ටමකට පත් වීම. ( $\frac{1}{2}$ x 04 = **ලකුණු** 02)

iv.
- සැලසුම්සහගත බවින් අඩු වීම.
- මහා පරිමාණ ව්‍යාපාර වලින් වල්ල වන තරඟකාරීත්වය
- දුර්වල මානව සම්බන්ධතා පැවතීම
- අතිරේක ප්‍රාග්ධන රැස්කර ගැනීමේ ගැටලුව
- ගිණුම් පොත් නිසි ලෙස පවත්වා නොගැනීම
- දැක්මක් අනුව කටයුතු නොකිරීම

**(පිළිගත හැකි වෙනත් කරුණු)** ( $\frac{1}{2}$ x 04 = **ලකුණු** 02)

v.
- ප්‍රාග්ධනය සපයා ගන්නා ආකාරය
- නීතිමය තත්ත්වයන් පිළිබඳ
- ව්‍යාපාරය වෙනුවෙන් කොතරම් කැපවිය හැකිද?
- තරඟයේ ස්වභාවය
- ඉලක්ක ගත පාරිභෝගිකයින් කවුරුන්ද?
- නිෂ්පාදිත සපයා ගන්නා ආකාරය
- ව්‍යාපාරය පිහිටුවන ස්ථානය පිළිබඳව
- ව්‍යාපාර සංවිධානය ප්‍රභේදනය කුමක්ද? ( $\frac{1}{2}$ x 04 = **ලකුණු** 02)

**(ලකුණු** 2x5=10)

03. i.
- ව්‍යාපාර පරිසර වෙනස්කම් වලට කැපවෙමින් කටයුතු කිරීම
- නව්‍යතා සම්පාදනය කිරීම
- අවදානම හොඳින් තක්සේරු කර, දැරිය හැකි අවදානම් භාර ගැනීම
- තරඟය අභියෝගයක් ලෙසට සැලකීම
- පවතින සීමිත සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම
- ශ්‍රමය නිර්මාණශීලිව යෙදවීම
- දිගු කාලීන දැක්මක් සහිතව කටයුතු කිරීම
- නව වෙළෙඳපොළවල් / නව පාරිභෝගිකයින් අත්පත් කර ගැනීම

**(පිළිගත හැකි වෙනත් කරුණු)** (1x 2 = **ලකුණු** 02)

ii.
- වගකීම අසීමිත වීම
- නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
- හවුල්කරුවන් අතර ගැටුම්/ මතභේද ඇති වීම
- ඉපයූ ලාභය, හවුල්කරුවන් අතර බෙදී යාම
- යම් හවුල්කරුවකුගේ නොමනා හැසිරීම, සෙසු හවුල්කරුවන්ට අහිතකරව බලපෑම

**(කරුණු 02 ට ලකුණු** 02)

iii.
- වැටුප් ලබන රැකියා කෙරෙහි පවතින ඉහළ පිළිගැනීම
- අවදානම/ අභියෝග වලට මුහුණ දීමට පවතින අකමැත්ත
- රාජ්‍ය දිරිගැන්වීම් ප්‍රමාණවත් මට්ටමින් සිදු නොවීම
- යැපුම් ආයතනික තත්ත්වයකින් යුක්ත වීම
- අවශ්‍යතාව තුලින් ගුණාත්මක හා ප්‍රමාණාත්මක උත්තේජනයක් සිදු නොවීම

**(පිළිගත හැකි වෙනත් කරුණු)** **(කරුණු 02 ට ලකුණු** 02)

iv.
- මූල්‍ය කළමනාකරු
- නිෂ්පාදන කළමනාකරු
- අලෙවි කළමනාකරු
- පිරිස් (මානව සම්පත්) කළමනාකරු
- ගබඩා කළමනාකරු

**(කරුණු 04 ට ලකුණු** 02)

v.
- ජනගහනයෙන් බහුතරයක් කාන්තාවන් වන නිසා
- රජයේ රැකියා සම්පාදනය අවම වීම
- කාන්තාවන් තුළ විරැකියාව බහුල වීම
- කාන්තා නායකත්වයට සුදුසු වන ව්‍යාපාර පැවතීම
- කාන්තාවන් ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීම
- ආර්ථිකය ඉහළ මට්ටමකට පත්කර ගැනීම වෙනුවෙන්

**(පිළිගත හැකි වෙනත් කරුණු)** **(කරුණු 04 ට ලකුණු** 02)

**(ලකුණු** 2x5=10)

04. i.
- අයිතිකරුවන්
- කළමනාකරුවන්
- බැංකු වැනි මූල්‍යායතන **(කරුණු 02 ට ලකුණු** 02)

ii.
- විධායක සාරාංශය
- අලෙවි සැලැස්ම
- මූල්‍ය සැලැස්ම
- නිෂ්පාදන සැලැස්ම
- පරිපාලන සැලැස්ම

**(කරුණු 04 ට ලකුණු 02)**

iii.
- ව්‍යාපාරයට අවශ්‍ය අරමුදල් ප්‍රමාණය කොතෙක්ද? යන්න නිශ්චය කර ගැනීමට
- එම අරමුදල් සම්පාදනය කර ගන්නා අන්දම තීරණය කර ගැනීමට
- මූල්‍ය ගැටලු/ දුෂ්කරතා අවම කර ගැනීමට
- ඉතිරි කාලයේදී ව්‍යාපාරය ලබන මූල්‍ය ප්‍රතිඵලය කොපමණද? යන්න දැන ගැනීමට

**(කරුණු 02 ට ලකුණු 02)**

iv.
- වෙළෙඳ සේවක වැටුප්
- ප්‍රචාරණ වියදම්
- විකුණුම් කොමිස්
- බෙදාහැරීමේ වාහන ක්ෂය
- අලෙවි මධ්‍යස්ථාන කුලිය
- අලෙවි කටයුතු වලට අදාළ දුරකථන ගාස්තු, ලිපිද්‍රව්‍ය වියදම්, කාර්යාල වියදම්.............

**(අයිතතම 04 කට ලකුණු 02)**

v. යෙදවුම් → පරිවර්තන ක්‍රියාවලිය → නිමැවුම්

උදා :-
- තිරිඟු පිටි
- යීස්ට්
- රසකාරක
- විදුලිය/දර
- පාන් පෝරණුව
- පාන් තැටි

→

- පිටි මිශ්‍ර කිරීම
- ඇනීම
- ඇතිරීම
- පිළිස්සීම

→ පාන්

**(නිදසුන් සහිත ක්‍රියාවලිය දැක්වීමට ලකුණු 02)**

**(ලකුණු 2x5=10)**

05. i.
- බැංකු වැනි මූල්‍ය ආයතනයකින් ණය මුදලක් සපයා ගැනීම
- වෙනත් බැංකුවකින් බැංකු අයිරා
- මූල්‍ය සමාගමකින් කල්බදු ණය ගැනීම
- අතිරික්ත ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍ර උපකරණ ආදී වත්කම් විකිණීමෙන්
- ඥාති හිතමිතුරකුගෙන් ණය ලබා ගැනීම

**(කරුණු 02 ට ලකුණු 02)**

ii.
- විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම
- යම් ගැටලුවකට එකම විසඳුමක් පමණක් යැයි සිතීම
- ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම
- ප්‍රායෝගිකව කටයුතු කිරීමට බිය වීම
- රීති සහ සම්ප්‍රදායන් අනවබෝධයෙන් පිළිපැදීම
- වැරදීම් හා විවේචන සඳහා බිය වීම
- තාර්කික පදනමක පිහිටන කටයුතු නොකිරීම

**(කරුණු 02 ට ලකුණු 02)**

iii.
- පාරිභෝගිකයින් ප්‍රශ්නාවලි ඉදිරිපත් කර පිළිතුරු ලබා ගැනීම
- පාරිභෝගිකයින් සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කිරීම
- පාරිභෝගිකයින් වෙළෙඳපොළේ කටයුතු කර ආකාරය නිරීක්ෂණය කිරීමෙන්
- පුවත්පත්, සඟරා, වාර්තා ආදී මූලාශ්‍ර මඟින්
- අන්තර්ජාලය මඟින්

**(කරුණු 04 ට ලකුණු 02)**

iv.
- වෙළෙඳපොළ සමීක්ෂණ මඟින්
- සැපයුම්කරුවවන් මඟින්
- ප්‍රදර්ශන මඟින්
- පුද්ගල දත්ත හා පළපුරුද්ද තුළින්
- ජනමාධ්‍ය තුළින්
- අධ්‍යාපනික පාඨමාලාවන් මඟින්
- පාරිභෝගික ප්‍රතිචාර තුළින්
- කරුණු කාර්යයන් අධ්‍යයනය තුළින්

**(කරුණු 04 ට ලකුණු 02)**

v.
- ආකර්ශනීය ඉපයුමක් තිබීම
- අවශ්‍ය සම්පත් සපයා ගත හැකි වීම
- නීතිරීති වලට අනුකූල වීම
- ඉල්ලුමක් තිබීම
- තරගකාරීත්වයට මුහුණ දීය හැකි වීම

**(කරුණු 02 ට ලකුණු 02)**

**(ලකුණු 2x5=10)**

06. i.

SMART BOOK SHOP

.................... ඇස්තමේන්තු මුදල් ප්‍රවාහ ප්‍රකාශය (රුපියල්)

| | | |
|---|---|---|
| <u>අපේක්ෂිත මුදල් ලැබීම්</u> | | |
| • ආයෝජන | 500 000 | |
| • බැංකු ණය | 400 000 ① | 900 000 |
| <u>අපේක්ෂිත මුදල් ගලා යෑම්</u> | | |
| • ඡායා පිටපත් යන්ත්‍ර | 250 000 | |
| • ලී බඩු උපකරණ | 150 000 ① | |
| • ව්‍යාපාරය ලියාපදිංචි කිරීම | 4 500 | |
| • ව්‍යාපාර සැලසුම සැකසීම | 18 000 | |
| • විදුලිය, දුරකතන ගාස්තු | 7 500 ① | |
| • ලිපි ද්‍රව්‍ය හා මෙහෙයුම් වියදම් | 280 000 | (710 000) |
| මුදල් ශේෂය | | 190 000 ① |

**(ලකුණු 04)**

ii. මුළු ආයෝජන ඇස්තමේන්තුව (රුපියල්)

| | අයිතිකරු | බැංකු ණය | මුලු ආයෝජන |
|---|---|---|---|
| <u>ස්ථාවර වත්කම්</u> | | | |
| • ගොඩනැගිලි | **300 000** | - | 300 000 |
| • ඡායා පිටපත් යන්ත්‍රය | - | **250 000** | 250 000 |
| • ලී බඩු උපකරණ | - | **150 000** | 150 000 |
| <u>මෙහෙයුම් වියදම්</u> | | | |
| • ලියාපදිංචි කිරීමේ වියදම් | **4 500** | - | 4 500 |
| • ව්‍යාපාර සැලසුම් සකස් කිරීම | **18 000** | - | 18 000 |
| <u>කාරක ප්‍රාග්ධනය</u> | | | |
| • විදුලිය, දුරකතන | **7 500** | - | 7 500 |
| • ලිපිද්‍රව්‍ය හා මෙහෙයුම් වියදම් | **280 000** | - | 280 000 |
| • මුදල් | **190 000** | - | 190 000 |
| මුළු ආයෝජනය | **800 000** | **400 000** | 1 200 000 |

**(තද කළු පාටින් ලකුණු කර ඇති අයිතම සඳහා $\frac{1}{2}$ බැගින් ලකුණු 05)**

**(මුළු ආයෝජනයට ලකුණු 01)** **(ලකුණු 06)**

**(ලකුණු 10)**

07. i. (අ) පරිසරයේ ඇති ගැටලුවට විසඳුමක් වන පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලන වාණිජමය වටිනාකමක් ඇති සියල්ල ව්‍යාපාර අදහස් වේ. **(ලකුණු 01)**

(ආ) කාර්ය විශ්ලේෂණය
සූක්ෂම විශ්ලේෂණය
ශදුඅත විශ්ලේෂණය (SWOT Analysis) **(කරුණු 02 ට ලකුණු 01)**

ii.
- සෞඛ්‍ය ආරක්ෂිත ආහාර නිෂ්පාදනය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වර්ධනය වීම
- සැකසූ ආහාර සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම
- ගෝලීයකරණය
- නැනෝ තාක්ෂණය තුළින් ඇති වන ව්‍යාපාර අවස්ථා
- පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා නැඹුරුවක් ඇති වීම
- පාරිභෝගිකයින් බලවත් (දැනුවත් බවින්) වීම
- ව්‍යාපාර අතරර තරඟය වැඩි වී තිබීම
- ලාභ අරමුණු ඉක්මවා සමාජ වගකීම් වැනි අරමුණු කරා යොමු වීම

**(පිළිගත හැකි වෙනත් කරුණු.......)** **(කරුණු 02 ට ලකුණු 02)**

iii.
- නව තාක්ෂණික උපකරණ භාවිතා කිරීම
- ආනයනය කරනු ලබන කෘෂි බීජ වර්ග කරා නැඹුරු වීම
- පරිසර හිතකාමී අයුරින් නිෂ්පාදනයට යොමු වීම
- රසායනික පොහොර භාවිතය වෙනුවට කාබනික පොහොර භාවිතයට යොමු වීම
- ගෙවතු වගාව ආශ්‍රිත කෘෂි නිෂ්පාදන සිදු කිරීම
- රාජ්‍ය අනුග්‍රහය විවිධ අයුරින් සිදු කිරීම

උදා:- නොමිලේ පෙපාහොර ලබා දීම
ඉහළ සහතික මිලක් යටතේ කෘෂි නිෂ්පාදන මිලදී ගැනීම
සහනදායී කොන්දේසි යටතේ වගා ණය ලබා දීම

**(පිළිගත හැකි වෙනත් කරුණු.......)** **(කරුණු 04 ට ලකුණු 02)**

iv.

කළමනාකාර අධ්‍යක්ෂ / සාමාන්‍යාධිකාරී
↓
නිෂ්පාදන කළමනාකරු
↓
සුපරීක්ෂක
↓
යන්ත්‍ර ක්‍රියාකරු
↓
නිෂ්පාදන සහායකවරු (සුලු සේවකයන්)

**(පාර්ශව 04 ක් අනුපිළිවෙලින් නම් කිරීමට ලකුණු 02)**

v.
- ආර්ථික වගකීම
- නීතිමය වගකීම
- සදාචාරාත්මක වගකීම
- පරාර්ථකාමී වගකීම **(කරුණු 04 ට ලකුණු 02)**

**(ලකුණු 2x5=10)**

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පොත් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

www.lol.lk
Learn Ordinary Level

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371



# LOL.lk online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්

















## කෙටි සටහන් පොත්




මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඔඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

